**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 32/89/(viii)**

මගේ අංකය: IV -2/9/77(H)1/5
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995 ජනවාරි 31 දින

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**විශ්‍රාම වැටුප් සහිත සේවාවන් වල සිටි යළි සේවයෙහි නොපිහිටවූ**
**<u>1980 ජූලි වැඩ වර්ජකයින් නැවත සේවයට කැඳවීම</u>**

මේ පිළිබඳව නිකුත් කරන ලද 1995.01.12 දිනැති 32/89/(vii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1 වගන්තියේ (I) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

> "වයස අවුරුදු 60 ට අඩු නිලධාරීන් නැවත රාජ්‍ය සේවයට පැමිණීමට කැමැත්තෙම්. ඔවුනට ඒ සඳහා 1995.02.01 දින සිට 1995.02.28 දින දක්වා සේවයට වාර්තා කල හැකිය. එම නිලධාරීන් තමන් අවසානයට සේවය කල ආයතනයට පැමිණ තමා සේවයට බැඳීමට කැමති බව ලිඛිතව වාර්තා කළ යුතුය. නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවේ තොරතුරු අනුව සුදුසු ස්ථානවල ඔවුන් සේවයේ පිහිටුවීමට අදල දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කොට සිය අමාත්‍යාංශයේ ලේකම්වරයාට/පත්වීම් බලධරයාට වාර්තා කල යුතුය. සේවයෙහි පිහිටුවීමේදී 1989.05.08 දින සිට 1995.02.01 දින දක්වා ඔවුන් සියළුම වැටුප් වර්ධක ලබමින් සේවයේ යෙදී සිටියා සේ සලකා නියමිත වැටුපෙහි හා ජ්‍යෝෂ්ඨත්වයෙහි පිහිටුවිය යුතුය.''

02. ඒ අනුව කටයුතු කරන්න.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය